# ඓතිහාසික පස්යොදුන් රට සංස්කෘතික පරිවර්තනයේ දී වැදගත් සංධිස්ථානයක් වන පැළෑඳ, ගල්කණු ගොඩැල්ල පුරාණ විහාරයේ පුරාවිද්‍යාත්මක අගය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ආර්.එම්. ඉෂිණි

පුරාවිද්‍යා හා උරුම කළමණාකරන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
ishinirathnayaka1998@gmail.com

**මුඛ්‍ය පද** - ඓතිහාසික, කළු ගඟ, පැළෑඳ, පස් යොදුන් රට, වීදියබණ්ඩාර

## හැඳින්වීම

මධ්‍යතන ශ්‍රී ලංකාවේ භූමි බෙදීමේ නිර්ණායක වලට අනුව පස්යොදුන් රට නමින් හැඳින්වෙන්නේ කළු ගඟත් බෙන්තර ගඟත් අතර මුහුදු වෙරළේ සිට රට මැදට වන්නට පිහිටි භූමි ප්‍රදේශයයි (ඉන්ද්‍රානන්ද, 1998). මෙරට මූලික ජනාවාස ව්‍යාප්ත වූ ප්‍රාග් ඓතිහාසික අවධියේ සිටම ඓතිහාසික යුගයේ අවසානය දක්වා වසර 40000 ක පමණ දීර්ඝ කාල පරිච්ඡේදයක් තිස්සේ මෙම ප්‍රදේශයේ මානව වාසයක් පැවති මේ වන විට පුරාවිද්‍යාත්මක සාධක අනුව අනාවරණය වී ඇත (සෝමදේව, 2015: 256). මෙම පර්යේෂණයේ ගැටළුව වන්නේ ඓතිහාසික පස්යොදුන් රට පවතින වැදගත් ස්ථානයක් වන පැළෑඳ ගල්කණු ගොඩැල්ල පුරාණ විහාරස්ථානය පුරාවිද්‍යාත්මක අගයෙන් යුතු ස්ථානයක් ද යන්න සොයා බැලීමයි. මෙම ලිපියේ මූලික අරමුණ වන්නේ ඓතිහාසික පැළෑඳ ගල් කණු ගොඩැල්ල පුරාණ විහාරය පස්යොදුන් රට ඓතිහාසිකත්වය නගා සිටුවන පුරාවිද්‍යාත්මක අගයෙන් යුතු තැනක් බවට තහවුරු කිරීමයි.

## ක්‍රමවේදය

මෙකී පර්යේෂණ ගැටළුව සාධනය කර ගැනීමට පළමුව ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදය යොදා ගන්නා ලදි. එහිදී මෙම අධ්‍යයන ක්ෂේත්‍රය හා එහි ඓතිහාසිකත්වය පිළිබඳ ලියවී ඇති ද්විතියික සාහිත්‍යමය මූලාශ්‍රයන් පරිශීලනය කිරීම සිදු කර ඇත. දෙවනුව ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය යොදා ගන්නා ලදි. එහිදී ක්ෂේත්‍රයට ගොස් එහි ගවේෂණය කොට සම්මුඛ සාකච්ඡා පවත්වමින් දත්ත රැස් කරගනු ලැබුවේය. එමෙන්ම වාර්තාගත ක්‍රමවේදය යටතේ ඡායාරූප වාර්තාගත කිරීමක් ද සිදු කළේය. මෙකී ක්‍රමවේද මෙම පර්යේෂණය සිදු කරගෙන යාමට උපකාරී විය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

පස්යොදුන් රට ඓතිහාසිකත්වය කියාපාන අප්‍රකට ස්ථානයක් ලෙස පැළෑඳ ගල්කණු ගොඩැල්ල විහාර භූමිය පෙන්වා දිය හැක. බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි මතුගම කලාපයට අයත් පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම විහාර භූමිය පිහිටා ඇත. පැළෑඳ ගල්කණු ගොඩැල්ල විහාර භූමියේ ඓතිහාසික කතන්දරය කෝට්ටේ යුගය තෙක් විහිදී යයි. එනම් වීදිය බණ්ඩාර කුමරු මෙම ස්ථානය ආශ්‍රිතව බලකොටුවක් නිර්මාණය කොට ගනිමින් සේනා සංවිධානය කිරීම නිසාවෙනි. මෙකී පැළෑඳ ගල්කණු ගොඩැල්ල විහාරය පිළිබඳ විවිධ පර්යේෂණ සිදු කර තිබුණද විධිමත් පර්යේෂණයක් තවමත් සිදු නොවී ඇති බවට පෙන්වා දිය හැක. පෘතුගීසීන්ගේ අත්අඩංගුවේ කොළඹ කොටුවේ සිර කර උන් වීදිය බණ්ඩාර කුමරු තම බිරිඳ වූ සමුද්‍ර දේවියගේ සහය ඇතුව ඉන් පලා යයි. පසුව රයිගමට පැමිණ අටලුගම හරහා පස්දුන් කෝරලයේ පැළෑඳ ප්‍රදේශයට පැමිණියේය. එතැන් සිට ඔහුගේ ප්‍රධාන පාලන මධ්‍යස්ථානය වූයේ මෙකී පැළෑඳ ප්‍රදේශයයි. මොහු තම බලකොටුව මෙම ප්‍රදේශයේ ඉදිකර ගත් අතර අද වන විට එහි නටබුන් පමණක් හඳුනාගත හැකි වන අතර ගල් කණු හතක් පමණ ඉතිරි වී පවතී.

මෙකී කෞතුක භාණ්ඩ අතර ඉතාමත් වැදගත් පුරාකෘති වූ වීදිය බණ්ඩාර කුමරුට අයත් නළල් පටය, වාස්තු මංජුසාවක් හා මැටියෙන් කළ විසුළු පෙනුමක් සහිත මුහුණක් සොයා ගෙන ඇති අතර ඒවා කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත (පූජ්‍ය දේවමුල්ලේ කල්‍යාණවංශ ස්වාමීන් වහන්සේ). මීට අමතරව කඩුවක කොටසක්, පැරණි අත් අත්පොරෝ කොටසක්, බිම් උළු කැටයක්, පබළු මාලයක්, මැටි කොතලය කෙම් කිහිපයක්, රිදී කිල්ලෝටයක්, පිත්තල සෙම්බුවක්, කාලතුවක්කු ගල් උණ්ඩයක් ආදි වශයෙන් පුරාකෘති ගණනාවක් පැළෑඳ බලකොටුව ආසන්නයෙන් සොයාගෙන ඇති බවට නායක හිමි විසින් තහවුරු කළේය. අද වන විට එකී පුරා කෘති සියල්ලම පැළෑඳ විහාරයේ කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත. මේ අනුව වීදිය බණ්ඩාර කුමරුගේ පැළෑඳ සිටි අවධිය වසර දෙකක් (ක්‍රි.ව. 1553-1555) වන අතර මොහු එකී බලකොටුව අංග අංගසම්පූර්ණ ලෙස ඉදිකර ඇති බව පෙන්වා දිය හැකි වේ.

බළකොටුව ඉදි කිරීම සඳහා ගල් කණු භාවිතා කිරීමෙන් පෙනී යන්නේ එය තාවකාලික ආරක්ෂක ස්ථානයක් වශයෙන් ඉදි කරන ලද්දක් නොවන බවයි (කන්නන්ගර, 2015:250). ප්‍රදේශයේ භූ විෂමතාව ද බලකොටුවකට සුදුසු මට්ටමේ පවතියි. ඒ අනුව වීදිය බණ්ඩාර කුමරු මෙම පැළෑඳ ප්‍රදේශය තම පාලන මධ්‍යස්ථානය ලෙස දිගටම තබා ගැනීමට අරමුණු කොට ගෙන උන් බව සිතිය හැකි වේ. පෘතුගීසි හමුදාව වීදිය වීදිය බණ්ඩාර කුමරු හා පැළෑඳ දී සටනකට එළැඹෙන අතර ඉන්පසු මෙම ප්‍රදේශය හැරදා කුමරු පලා යාම සිදු කරයි (කන්නන්ගර, 2015:250). එතැන් සිට පැළෑඳ බලකොටුවේ අභාවය සිදු වන අතර පෘතුගීසි සේනා බලකොටුව විනාශ කරයි (කන්නන්ගර, 2015:230).

පී.ඊ. පීරිස් මහතා විසින් මෙම පැළෑඳ බලකොටුව පරීක්ෂා කොට එහි සොයාගත් පුරාවස්තු පිළිබඳව සටහනක් ද සටහනක්ද තබා ඇත (කන්නන්ගර, 2015:250). මෙම පුරාවස්තු පිළිබඳ අධ්‍යයනය මඟින් පහළොස්වන සියවසේ දී ශ්‍රී ලංකාවේ සමෘද්ධිමත්ව වැජඹුණු කෝට්ටේ රාජධානි සමය පිළිබඳව ද හඳුනාගත හැකි වේ. කඩු, ඊතල, ගල් උණ්ඩ එකල සටන් ඇති වූ කල ප්‍රයෝජනයට ගත් උපකරණ විය හැක. එමෙන්ම කුමරුගේ නළල් පටය එකළ රාජකීය සංකේතයක් සේ පෙන්වා දිය හැකි වේ. එසේම වාස්තු මංජුසාවක් හමුවීමෙන් මෙකල ගොඩනැගිලි නිර්මාණය කරන විට එහි ආරක්ෂාව හා සුබසෙත පතා නිධන් වස්තු නිධන් කරන්නට ඇති බව නිගමනය කළ හැකි වේ. එමෙන්ම බිම් උළු කැටයක් හමුවී ඇති අතර එකල ගොඩනැගිලි ඉදිකිරීමේ දී ගොඩනැගිල්ලේ බිම් කොටසට වර්තමානයේ ටයිල් භාවිතා භාවිත කරන්නා සේ බිම් උළු කැට යොදා ගෙන ඇත. මේ ආකාරයෙන් මෙම පැළෑඳ ගල්කණු ගොඩැල්ල විහාරය ආශ්‍රිත භූමියෙන් වීදිය බණ්ඩාර සමයේ පුරාකෘති ගණනාවක් හමු වී තිබීමෙන් පෙනී යන්නේ මෙම ස්ථානය පුරාවිද්‍යාත්මක අගයෙන් අනූන වූ ස්ථානයක් වශයෙන් ගැනෙන බවයි. ඒ අනුව වීදිය බණ්ඩාර කුමරුගේ මෙම පැළෑඳ බලකොටුව පිහිටි විහාර භූමිය පුරාවිද්‍යාත්මක අගයෙන් සන්නද්ධ වූ වැදගත් ස්ථානයක් බවට නිගමනය කළ හැක.

**ආශ්‍රිත මූලාශ්‍රය**


පත්බේරියේ ඉන්ද්‍රානන්ද නායක ස්ථවිර, (1998)ල ***පස් යොදුන් රට ඉතිහාසය***, බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය.

සෝමදේව, ආර්, (2015)ල ***පස් යොදුන් රට ඓතිහාසික පසුබිම***, කළුතොට ශාස්ත්‍රීය සංග්‍රහය, ඇස්. ගොඩගේ සහා සහෝදරයෝ.

පත්මසිරි කන්නන්ගර, (2015)ල ***පස් යොදුන් රට ඉතිහාසයෙහි විශේෂිත සන්ධිස්ථාන***, කළුතොට ශාස්ත්‍රීය සංග්‍රහය, ඇස්. ගොඩගේසහාසහෝදරයෝ.